# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2077/31 – 2018 ජුනි 28 වැනි බ්‍රහස්පතින්දා – 2018.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දෙවත්ත, ගල්වඩුගොඩ ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/ජීඑෆ්ජී/2017/778 හා 2017.12.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0054**
උතුරට: ටී. බී. සේපාලි ධම්මිකා දන්තනාරායන හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: මෝඩ ඇළ; දකුණට: මෝඩ ඇළ සහ කැපූ ඇළ; බටහිරට: ටී. බී. සේපාලි ධම්මිකා දන්තනාරායන හිමිකම් කියන ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – දූවෙවත්ත, තල්ගහවත්ත හෙවත් ලන්සියාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0003**
උතුරට සහ නැගෙනහිරට: මෝඩ ඇළ; දකුණට: කාණුව සහ කේ. ඒ. ප්‍රියංකර හිමිකම කියන දූවෙවත්ත, තල්ගහවත්ත හෙවත් ලන්සියාවත්ත; බටහිරට: කේ. ඒ. ප්‍රියංකර හිමිකම් කියන දූවෙවත්ත, තල්ගහවත්ත හෙවත් ලන්සියාවත්ත.

03. **කැබලි අක්ෂර 'සී' – අලුත් අස්වැද්දුම – ප්‍රමාණය: හෙක්. 0.0008**
උතුරට: මාර්ගය; නැගෙනහිරට: අසෝක ගුණසේකර හිමිකම් කියන අලුත් අස්වැද්දුම; දකුණට: මෝඩ ඇළ; බටහිරට: මෝඩ ඇළ සහ මාර්ගය.

04. **කැබලි අක්ෂර 'ඩී' – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0002**
උතුරට: ලක්ෂ්මන් ආනන්ද හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: මෝඩ ඇළ සහ මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: ලක්ෂ්මන් ආනන්ද හිමිකම් කියන ඉඩම.

05. **කැබලි අක්ෂර 'ඊ' – දූවෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0002ක් පමණ**
උතුරට: මෝඩ ඇළ සහ එස්. නාගහවත්ත හිමිකම් කියන දූවෙවත්ත; නැගෙනහිරට: එස්. නාගහවත්ත හිමිකම් කියන දූවෙවත්ත; දකුණට: මාර්ගය; බටහිරට: මෝඩ ඇළ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය 4-3/11/2017/යූඩී/71.
2018 මැයි මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 335